ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි පාඨමාලාව
තුන්වන මට්ටම
පැවරුම් පරීක්ෂණය 2016/2017
මූල්‍ය හා පිරිවැය ගිණුම්කරණය - MCU1206

The Open University of Sri Lanka
21 JAN 2017
AFTERNOON
Badulla Regional Centre

කාලය පැය දෙකයි (02)

| දිනය: **21.01.2017** | වේලාව: ප.ව. **2.00** සිට ප.ව.**4.00** |
|---|---|

උපදෙස්

- ප්‍රශ්න පත්‍රයේ මුළු ප්‍රශ්න ගණන හතරකි.
- පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ඕනෑම ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්වන්න.
- වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

ප්‍රශ්ණ අංක (01)

පහත සඳහන් ශේෂ පිරික්සුම ප්‍රවීන් එන්ටර්ප්‍රයිසිස් හි පොත් වලින් 2016 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා උපුටා ගන්නා ලදි.

| විස්තරය | රු. | රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 164,860 |
| අලෙවි ආදායම | | 218,000 |
| ගැනුම් | 51,000 | |
| ණය ගැතියෝ/ණය හිමියෝ | 45,000 | 76,000 |
| තොගය (01/04/2015) | 40,000 | |
| ඉඩම් | 150,000 | |
| යන්ත්‍ර සූත්‍ර (පිරිවැයට) | 40,000 | |
| මෝටර් රථ (පිරිවැයට) | 14,800 | |
| ලී බඩු සහ සවිකිරීම් (පිරිවැයට) | 12,000 | |
| සමුච්චිත ක්ෂය | | |
| යන්ත්‍ර සූත්‍ර | | 4,000 |
| මෝටර් රථ | | 740 |
| ලී බඩු සහ සවිකිරීම | | 1,200 |
| වේතන | 35,000 | |
| වැටුප් | 20,000 | |
| ගෙන ඒමේ කුලී | 1,500 | |
| රක්ෂණය | 2,800 | |
| බොල් ණය | 1,200 | |
| කාර්යාල වියදම් | 1,800 | |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 4,000 | |
| ආපසු එවුම් සහ ආපසු යැවුම් | 2,000 | 2,650 |
| ගැනිලි | 45,000 | |
| ලැබිය යුතු බිල් සහ ගෙවිය යුතු බිල් | 3,000 | 33,800 |
| දූන් වට්ටම් | 1,500 | |
| විවිධ වියදම් | 5,250 | |
| මුදල් සහ බැංකු ශේෂය | 25,400 | |
| මුළු එකතුව | 501,250 | 501,250 |

2016.03.31 වන දිනට පහත සඳහන් අතිරේක තොරතුරු ඔබට සපයා ඇත.

a. වත්කම් සඳහා ක්ෂය මෙම වර්ෂය සඳහා තවම ගණනය කොට නොමැත. ක්ෂය අනුපාත පහත පරිදි වේ. (ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමයට කළ යුතුය)

| | |
|---|---|
| මෝටර් වාහන | 5% |
| යන්ත්‍ර සහ පිරියත | 10% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |

b. ණය ගැතියන් වෙනුවෙන් අඩමාණ ණය ප්‍රතිපාදන, ණය ගැතියන්ගෙන් 5%ක් විය යුතුය.
c. 2016 මාර්තු 31 දිනට ඉදිරියට කළ රක්ෂණය රු.500.
d. 2016 මාර්තු 31 දිනට උපචිත කාර්යාල වියදම් රු. 500.
e. 2016 මාර්තු 31 වන දිනට තොග වටිනාකම රු..38,000, එයින් රු. 3,000 වටිනා තොග භාවිතයට ගත නොහැකි ලෙස හානි වී ඇත, එය කපා හැරිය යුතුය.

ඉහත තොරතුරු භාවිතයෙන් පහත දෑ පිළියෙල කරන්න

i. 2016.03.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයක් පිළියෙල කරන්න.
ii. 2016.03.31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(මුළු ලකුණු 34)

ප්‍රශ්ණ අංක (02)

I. පොත් තැබීම සහ ගිණුම්කරණය අතර වෙනස්කම් දක්වන්න (ලකුණු 05)

II. ජර්නල් සටහන් යන්න අර්ථ දක්වන්න (ලකුණු 02)

III. අම්බිකා ස්ටෝස් හි 2016 මාර්තු මාසය තුල සිදුවූ පහත ගණුදෙනු ප්‍රධාන ජර්නල්යට පිටපත් කරන්න.

| දිනය | විස්තරය | රු. |
|---|---|---|
| 1/3/2016 | අම්බිකා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ප්‍රාග්ධනය ලෙස මුදල් ගෙන ඒම. | 60,000 |
| 10/3/2016 | ලී බඩු මිලදී ගත්තා. | 10,000 |
| 15/3/2026 | කලා එන්ටර්ප්‍රයිසස් වෙතින් භාණ්ඩ තොග මිලදී ගැනීම. | 25,000 |
| 17/3/2016 | සේවකයන්ට වේතන ගෙව්වා. | 7,000 |
| 25/3/2016 | පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් නැවත ලබා ගත්තා. | 10,000 |
| 31/3/2016 | භාණ්ඩ තොග අලෙවි කළා. | 35,000 |

(ලකුණු 12)

IV. ද්විත්ව සටහන් ගිණුම්කරණ ක්‍රමය යන්න නිර්වචනය කරන්න (ලකුණු 03)

V. පහත ගණුදෙනු විශ්ලේෂණ තීරු සහිතව සුළු මුදල් පොතක වර්තා කරන්න.(විශ්ලේෂණ තීරු ලෙස මෝටර් රථ වියදම්, තැපැල් ගාස්තු, නිෂ්කාශන වියදම්, ලිපි ද්‍රව්‍ය සහ ගමන් වියදම් ආදිය භාවිතා කරන්න)

| දිනය | වවුචර් අංකය | ගණුදෙනු |
|---|---|---|
| 25/8/2016 | | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා රු.25,000 |
| 26/8/2016 | 125 | මෝටර් රථ අළුත් වැඩියා කළා රු.2,500 |
| | 126 | තැපැල් ගාස්තු රු.450 |
| | 127 | ඉන්ධන ගාස්තු රු.1,200 |
| | 128 | පිරිසිදු කිරීමේ වියදම් රු.2,400 |
| | 129 | ප්‍රවාහන වියදම් රු.1,950 |
| | 130 | ලිපි ද්‍රව්‍ය රු.1,900 |
| 28/8/2016 | 131 | වාල්ස් ගේ ගිණුම පියවීමට ගෙවීම් කළා රු.3,000 |
| | 132 | තැපැල් ගාස්තු රු.520 |
| | 133 | ඉන්ධන ගාස්තු රු.1,900 |
| 29/8/2016 | 134 | නිෂ්කාශන වියදම් රු.2,900 |
| | 135 | ප්‍රවාහන වියදම් රු.1,200 |
| | 136 | ලියුම් කවර සහ මුද්දර ගාස්තු රු. 600 |
| | 137 | ඉන්ධන ගාස්තු රු.1,500 |

(ලකුණු 11)
(මුළු ලකුණු 33)

ප්‍රශ්ණ අංක (03)

I. පහත සඳහන් ගිණුම්කරණ සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

i. අඛන්ඩ පැවැත්ම සංකල්පය.

ii. මුල්‍ය මිනුම් සංකල්පය. (ලකුණ 06)

II. "ගිණුම්කරණ සමීකරණය " යන්න නිර්වචනය කරන්න (ලකුණු 02)

II. පහත සඳහන් අවස්ථාවන් සඳහා ව්‍යාපාරයකට අදාලව එක් ගණුදෙනුව බැගින් දක්වමින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑමට උදාහරණ සපයන්න.

i. එක් වත්කමක අගය වැඩිවන අතර තවත් වත්කමක අගය අඩුවීම.
ii. එක් වත්කමක අගය වැඩිවන ප්‍රමාණයට සමානව වෙනත් වගකීමක අගය වැඩිවීම.
iii. එක් වත්කමක අගය වැඩිවන ප්‍රමාණයට සමානව අයිතිකරුගේ හිමිකම ඉහල යාම.
iv. එක් වත්කමක අගය අඩුවෙන ප්‍රමාණයට සමානව අයිකරුගේ හිමිකම පහල යෑම.
v. එක් වත්කමක අගය අඩුවෙන අතර ඊට සමානව වගකීමක අගය අඩුවීම.

(ලකුණු 10)

IV. "ගිණුම්කරණ ප්‍රකාශනය" යන්න නිර්වචනය කරන්න (ලකුණු 02)

V. පහත සඳහන් පාර්ශවයන් මූල්‍ය වාර්ථා භාවිතා කිරීමේ පරමාර්ථ කවරේද?

i. අයිතිකරුවෝ
ii. මූල්‍ය විශ්ලේෂකයෝ
iii. බැංකු සහ මූල්‍ය ආයතන
iv. ගණුදෙනු කරුවෝ (ලකුණු 08)

VI. පහත එකිනෙක ගණුදෙනුව සඳහා මූලික පොත සහ ප්‍රභව ලියකියවිලි සඳහන් කරන්න

| | ගණුදෙනු | මූලික පොත | ප්‍රභව ලියකියවිලි |
|---|---|---|---|
| අ. | භාණ්ඩ ණයට විකුණුම් | ? | ? |
| ආ. | විකුණුම් ආපසු ලැබීම් | ? | ? |
| ඇ | මුදල් ලැබීම් සහ ගෙවීම් | ? | ? |
| ඈ | සුළු මුදල් ගෙවීම් | ? | ? |
| ඉ | වැරදි නිවරදි කිරීම් | ? | ? |

(ලකුණු 05)
(මුළු ලකුණු 33)

ප්‍රශ්ණ අංක (04)

පහත සඳහන් දෑ සඳහා කෙටි සටහන් ලියන්න. එකිනෙක පිළිතුරු සඳහා වාක්‍ය 4-5ක් පමණ ලිවීම ප්‍රමාණවත් වේ.

I. සුළු මුදල් අග්‍රිම ක්‍රමය
II. ලෙජරය
III. වත්කමක සාධාරණ වටිනාකම
IV. බැංකු අයිරාව
V. පළමු ලැබීම් පළමු නිකුතු ක්‍රමය
VI. පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය
VII. ශේෂ පිරික්සුම
VIII. නිෂ්පාදන ගිණුම
IX. හිමිකම් සහ වගකීම්
X. උපචිත වියදම්
XI. අයභාර වියදම් සහ ප්‍රාග්ධන වියදම්

(එකකට ලකුණ 03 බැගින් හිමිවේ)
(03*11 = ලකුණු 33කි)

(මුළු ලකුණු 100කි)

**සියලුම හිමිකම් ඇවිරිණි.**

THE OPEN UNIVERSITY OF SRI LANKA
BACHELOR OF MANAGEMENT STUDIES DEGREE PROGRAMME
LEVEL – 3
ASSIGNMENT TEST EXAMINATION 2016/2017
FINANCIAL AND COST ACCOUNTING - MCU1206
DURATION: TWO (02) HOURS

Sample
THE OPEN UNIVERSITY OF SRI LANKA ★ JAFFNA REGIONAL CENTRE
21 JAN 2017

| DATE: 21.01.2017 | TIME: 2.00PM-4.00PM |
|---|---|

INSTRUCTIONS

- **There are four questions in the question paper.**
- **Answer to the first question and any other two (02) questions.**
- **All the workings should be shown clearly.**
- **Use of non-programmable calculator is allowed.**

**Question (01)**

The following trail balance was extracted from the books of Praveen Enterprises as at 31st March 2016.

| **Description** | **Rs.** | **Rs.** |
|---|---|---|
| Capital | | 164,860 |
| Sales | | 218,000 |
| Purchases | 51,000 | |
| Debtors/ creditors | 45,000 | 76,000 |
| Inventory (01/04/2015) | 40,000 | |
| Land | 150,000 | |
| Plant and machinery (cost) | 40,000 | |
| Motor vehicle (cost) | 14,800 | |
| Furniture & fittings (cost) | 12,000 | |
| **Accumulated depreciation** | | |
| Plant and machinery | | 4,000 |
| Motor vehicle | | 740 |
| Furniture & fittings | | 1,200 |
| Salaries | 35,000 | |
| Wages | 20,000 | |
| Carriage inwards | 1,500 | |
| Insurance | 2,800 | |
| Bad debts | 1,200 | |
| Office expense | 1,800 | |
| Printing & stationary | 4,000 | |
| Return in wards/out wards | 2,000 | 2,650 |
| Drawings | 45,000 | |
| Bills Receivable/Bills Payable | 3,000 | 33,800 |
| Discount given | 1,500 | |
| Sundry expenses | 5,250 | |
| Cash and bank balances | 25,400 | |
| **Total** | **501,250** | **501,250** |

You are given the following additional information as at 31.03.2016.

a. Depreciation of the assets for this year has not been calculated. Depreciation rates are as follows. (Use Straight Line Method)

| | |
|---|---|
| Motor Vehicle | 5% |
| Plant and Machinery | 10% |
| Furniture & Fittings | 10% |

b. Provision for doubtful debts should be equal to the 5% of debtors.

c. Pre-paid insurance on 31st March 2016 was Rs 500.

d. Accrued office expenses Rs. 500.

e. Closing inventory as on 31st March, 2016 was Rs.38,000 of which inventory worth Rs. 3,000 is obsolete and to be written off.

Using the above information, you are required to prepare followings

I. Income Statement for the year ended 31.03.2016

II. Statement of Financial Position as at 31.03.2016

**(Total 34 Marks)**

**Question (02)**

I. What are the differences between "**Book-keeping**" and "**Accounting**".**(05 Marks)**

II. Define the term "**Journal Entries**". **(02 Marks)**

III. Write down Journal entries to the following transactions in the books of Ambika Stores for the month of March 2016.

| Date | Description | Rs. |
|---|---|---|
| 1/3/2016 | Ambika started business and brought cash as the Capital | 60,000 |
| 10/3/2016 | Purchased furniture | 10,000 |
| 15/3/2026 | Bought Inventories from Kala Enterprises | 25,000 |
| 17/3/2016 | Paid salaries to employees | 7,000 |
| 25/3/2016 | Withdraw cash for personal use | 10,000 |
| 31/3/2016 | Inventories sold | 35,000 |

**(12 Marks)**

IV. Define "**Double Entry System**". **(03 Marks)**

V. Record the following transactions in Petty Cash book with analysis columns. (Use motor vehicle expenses, Postage, Clearing expenses, Stationary and travelling as analysis columns.)

| Date | Voucher No. | Transaction |
|---|---|---|
| 25/8/2016 | | Petty cash imprest received Rs. 25,000 |
| 26/8/2016 | 125 | Repairs to motor vehicle Rs. 2,500 |
| | 126 | Postage Rs. 450 |
| | 127 | Petrol Rs. 1,200 |
| | 128 | Cleaning expenses Rs. 2,400 |
| | 129 | Traveling expenses Rs. 1,950 |
| | 130 | Stationery Rs. 1,900 |
| 28/8/2016 | 131 | Payment to Mr.Charles for settlement of his account Rs. 3,000 |
| | 132 | Postage Rs. 520 |
| | 133 | Petrol Rs. 1,900 |
| 29/8/2016 | 134 | Clearing expenses Rs. 2,900 |
| | 135 | Travelling expenses Rs. 1,200 |
| | 136 | Envelopes and stamps Rs. 600 |
| | 137 | Petrol Rs.1,500 |

**(11Marks)**

**(Total 33 Marks)**

**Question (03)**

I. Briefly explain following accounting concepts.

i. Going Concern concept.

ii. Money measurement concept. **(06 Marks)**

II. Define the term "**Accounting Equation**". **(02 Marks)**

III. State one transaction as an example for each of the following entries that can affect the accounting equation of a business.

i. An increase in one asset with a decrease in another asset.

ii. An increase in one asset with an equal amount of increase in liability.

iii. An increase in asset with an equivalent rise in the proprietor's equity.

iv. A decrease in asset with an equivalent decrease in the proprietor's capital.

v. A decrease in asset with an equal amount of decrease in liability.

**(10 Marks)**

IV. Define the term "**Financial Statement**". **(02 Marks)**

V. For what purpose financial statements are used by following users.

i. Owners.

ii. Financial Analyst

iii. Banks and financial institutions

iv. Customers

**(08 marks)**

VI. Write down name of the primary books and source documents against each of the following transactions.

| | Transactions | Primary Book | Source Document |
|---|---|---|---|
| a. | Goods sold for credit | ? | ? |
| b. | Return inwards | ? | ? |
| c. | Cash receipts & payments | ? | ? |
| d. | Petty cash payments | ? | ? |
| e. | Correction of errors | ? | ? |

**(05 Marks)**
**(Total 33 Marks)**

**Question (04)**

Write short notes on the following. You are required to write maximum 4-5 sentences in answering for each topics.

I. Petty cash imprest system

II. Ledger

III. Fair value of assets

IV. Bank overdraft

V. First in First Out (FIFO) method

VI. Cost Accounting and Management Accounting

VII. Trial Balance

VIII. Manufacturing Account

IX. Equity and liabilities

X. Accrued expenses

XI. Revenue Expenditure and Capital Expenditure

**(03 Marks for each)**
**(03*11 = 33 Marks)**

**(Total 100 Marks)**

**All Rights Reserved**